

## ❖ 31 - සමාධි පිළිම වහන්සේ

අද මම පුතාලට කියා දෙන්න යන්නෙ සමාධි පිළිම වහන්සේ ගැන.

අනුරාධපුරයේ මහමෙවුනා උයනේ තමයි පුතේ මේ පිළිම වහන්සේ වැඩ සිටින්නෙ.බුදුන් වහන්සේගේ මහා කරුණා ගුණය ඉස්මතු වන ආකාරයට කළු ගලෙන් නෙළල තිබෙන මේ පිළිම වහන්සේ දැක්කම පුදුම හිතෙනවා.. දේවානම් පියතිස්ස රජතුමාගෙ කාලෙ එතුමාගෙ උපදෙස් අනුව සාදා නිමකර තිබෙන සමාධි පිළිම වහන්සේ අපේ රටේ වටිනා දායාදයක්.

1. දැන් පුතාල මේ ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

- සමාධි පිළිමය සාදා තිබෙන්නේ කුමන උයනකද?
- මෙම උයන තිබෙන්නෙ කුමන නගරයේද?
- මෙම පිළිමය සාදා තිබෙන්නෙ කුමකින්ද?
- සමාධි පිළිම වහන්සේගෙන් ඉස්මතු වන්නෙ කුමන ගුණයක්ද?

2. මේ කවිය තාලයට ගායනා කරන්න. මතක තබා ගන්න.

මහමෙවුනා වන උයනේ
සමාධියෙන් වැඩ ඉන්නේ
ජීවමාන සෙල් පිළිමේ
සාධු සාධු නමදින්නේ

3. සමාධි පිළිමයේ පින්තූරයක් සොයා ගන්න. එය පොතේ අලවා ඊට යටින් මේ කවිය ලියන්න

4. පුතේ ඔයාල දෙමව්පියන් එක්ක පැරණි පන්සලක් බලන්න යන්න. ඒ පන්සල ගැන තොරතුරු සොයන්න. ඉන් පසුව ඒ තොරතුරු යාළුවන්ට කියන්න.